# ජනාධිපතිතුමාගේ නිදහස් දින පණිවුඩය

ශ්‍රී ලංකා ජනාධිපති

இலங்கை சனாதிபதி

**President of Sri Lanka**

## නිදහස් දින පණිවුඩය

පුරා 133 වසරක් බ්‍රිතාන්‍ය යටත් විජිතයක් ව පැවැති ශ්‍රී ලංකාව, ස්වාධීන රාජ්‍යයක් බවට පත් වූ දිනය හැම වසරක ම පෙබරවාරි 4 වැනිදා මෙ සේ උත්සවශ්‍රීයෙන් අනුස්මරණය කරනු ලැබේ. එහෙත් මේ මොහොතේ අප සියල්ලන් ගේ ඒකායන අරමුණ විය යුත්තේ ලැබූ නිදහසේ උපරි අර්ථය සාක්ෂාත් කර ගැනීම පිණිස නව දැක්මකින්, අභිනව ජවයකින් සාමූහික ව කැපවීම යි.

අධිරාජ්‍යවාදීන් ගෙන් නිදහස ලැබීමෙන් දේශයක්, ජාතියක් ලෙස අප අපේක්ෂා කළේ සියලු ආකාරවලින් ඔවුන් ගේ වියගසින් මිදුණු, ස්වදේශීය අනන්‍යතාවකින් හෙබි ආර්ථික දේශපාලනික හා සමාජ සංස්කෘතික පෙරගමනකි. ශතවර්ෂාධික කාලයක පරාධීනත්වයෙන් අධිරාජ්‍යගැති බවට පත් මනස්වලට දේශයේ අනාගතය භාර වීම යනු, අධිරාජ්‍යවාදයට වඩා භයානක ප්‍රතිඵල අත්කර දෙන්නකි.

එහෙයින් අනාගත අභිවෘද්ධිය උදෙසා අපට අවශ්‍ය වනුයේ ස්වදේශිකත්වයෙන් ම පණ පෙවුණු අධ්‍යාත්මයන් ගෙන් යුතු ජනකායකි.

අතීත රජ දවස ලොව අන්‍ය මහා ශිෂ්ටාචාරයන් විසින් ඉටු කරගැනුණු කාර්ය සාධනයන්, ඒ හා සමාන සාර්ථකත්වයකින් අපට ද සපුරාගත හැකි වූයේ ඒ කිසිවකට ණයගැති වීමෙන් නො වේ. ස්වාධීන වීමෙනි. අපි අපේ ම ජාතික අනන්‍යතාවක් මුල සිට ම ගොඩනගාගත් මිනිස්සු වෙමු. එහෙයින් දේශීය ආර්ථිකයේ පදනම ලෙස කෘෂිකර්මාන්තය ස්ථාපිත කළ යුතු කාලය යළි එළැඹ ඇති වග මේ අනුස්මරණීය දිනයේ මම ඔබ සැමට අවධාරණය කරනු කැමැත්තෙමි.

එ සේ ම ජාතික පුනර්ජීවනය ඇති කිරීමේ ලා අත්‍යවශ්‍ය වන ප්‍රගතියට එරෙහි ව සිටින පොදු සතුරා වන දුගී භාවය සහ දූෂණය වහා මුලිනුපුටා දැමීමට අප සියල්ලන් එක්සිත් ව කටයුතු කළ යුතු ව ඇත.

අධිරාජ්‍යවාදී පාලන සමයේ සිට ම ජාතික ස්වාධීනත්වය වෙනුවෙන් කැප වූ, දිවි පිදූ සියලු වීරවරයන් මේ මොහොතේ ගෞරව බහුමාන පෙරදැරි ව සිහිපත් කරන අතර, වර්තමානයේ දේශයේ නිදහස, ස්වෛරීත්වය සුරක්ෂිත කිරීමට දිවි හිමියෙන් කැප වී සිටින සියලු රණවිරුවනට කෘතඥතාපූර්වක ව ශුභාශිංසනය කරමි.

තව ද සියලු දේශපාලන පාර්ශ්වයන්ටත්, අපටත්, ඔබ සැමටත් තිර අදිටනින්, සමඟි ව දිනූ නිදහසේ යහ අරමුණු සපුරාගනු පිණිස සමඟි ව පෙරට යෑමට හැකි වේ වා යි මේ නිදහස් සමරු දිනයේ ප්‍රාර්ථනය කරනු කැමැත්තෙමි.

මෛත්‍රීපාල සිරිසේන

2019 පෙබරවාරි මස 04 වන දින

**අනුග්‍රහය :** ජනාධිපති මාධ්‍ය ඒකකය